සලාතය ඉටු කිරීම සඳහා ඇරයුම් කරනු ලැබ, රාත්රී භෝජනය ද ගෙනැවිත් ඇති විටෙක රාත්රී භෝජනයෙන් ආරම්භ කරන්න.

ආඉෂා, අබ්දුල්ලාහ් ඉබ්නු උමර් හා අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හුම්) යන අය
විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “සලාතය ඉටු කිරීම සඳහා ඇරයුම් කරනු ලැබ, රාත්රී භෝජනය ද ගෙනැවිත් ඇති විටෙක රාත්රී භෝජනයෙන් ආරම්භ කරන්න.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [සියලු වාර්තා සම්බන්ධතාවන් සමඟ බුහාරි හා මුස්ලිම් හි එය වාර්තා වී ඇත]

ආහාර හෝ පාන ඉදිරියේ තිබියදී සලාතය සඳහා ඇරයුම් කරනු ලබන විටෙක සලාතය ඉටු කරන්නාගේ ආශාවන් බිඳී යන තෙක් ඒ ගැන මතකය බැඳී නොපවතින පරිදි සලාතය පිළිගැනෙන අයුරින් පළමුව ආහාර පානවලින් ආරම්භ කළ යුතුය. නමුත් සලාතයේ නියමිත වේලාව කෙටි නොවී තිබීම, ඒ සඳහා අවශ්යතාවක් පැවතීම හා ආහාරපාන සමග බැඳී සිටීම යනාදිය එහි කොන්දේසි වන්නේය. මෙය පහසුව හා සමාව සමග ආත්ම උරුමය වෙනුවෙන් වූ ෂරීආ පිළිවෙතෙහි පූර්ණභාවය හා එහි සැලකිලිමත්භාවය තහවුරු කරයි.

https://sunnah.global/hadeeth/si/show/3066